මෙම කොටස සඳහා වෙනම පිළිතුරු පොතක් භාවිත කළ යුතුය. එහි විෂය ලෙස ලිවිය යුත්තේ **"කළමනාකරණය"** යන්න පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අන්තර්මධ්‍ය විභාගය - 2012 ජනවාරි**

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**කළමනාකරණය**

Management

2012-01-29
පස්වරු
[3.30 – 5.00]

**කාලය: පැය 1 විනාඩි 30 යි.**

පිටු ගණන: 02
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

*(1) මෙම ප්‍රශ්න පත්‍රය - **ව්‍යාපාර නීතිය හා කළමනාකරණය** යන විෂයයේ **කළමනාකරණය** කොටස යි.*

*(2) **ඕනෑම ප්‍රශ්න පහක (05) ට උත්තර ලියන්න.***

*(3) විභාගයට අයදුම් කළ භාෂා මාධ්‍යයෙන්, සපයා ඇති පිළිතුරු පොත්වල උත්තර ලිවිය යුතු ය.*

*(4) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය විෂයය සමත් වීම සඳහා අයදුම්කරුවකු, ව්‍යාපාර නීතිය හා කළමනාකරණය යන එක් එක් කොටසට, අවස්ථාවෝචිත පරිදි, 40% හෝ 50% බැගින් වූ අවම ලකුණු මට්ටමක් ලබාගත යුතු ය.*

*(5) ලකුණු 50.*

---

**01.** (a) "ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවය" (stakeholder) යන යෙදුම නිර්වචනය කර සංවිධානයක දක්නට ඇති ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

(b) "සංවිධානයක් යනු සමාජ-ආර්ථික ඒකකයකි". පැහැදිලි කරන්න. (ලකුණු 05)

(c) ව්‍යාපාරයක සමාජ වගකීම් වර්ග තුනක්(03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**02.** (a) ඔබ තීරණ ගැනීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(b) "කළමනාකරුවන් සැම විටම තාර්කික තීරණ ගත යුතුය". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(c) සඵලදායී සැලසුම්කරණයක් සඳහා බලපාන සංරෝධක (barriers) තුනක්(03) විස්තර කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**03.** (a) "සංවිධාන ව්‍යුහය" (Organisation Structure) නිර්වචනය කරන්න. (ලකුණු 02)

(b) පාලන විතස්තිය / පාලන අවකාශය (span of control), සංවිධාන ව්‍යුහයේ ස්වභාවය තීරණය කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 03)

(c) විධිමත්කරණයේ (formalization) වාසි හා අවාසි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

04. (a) "අභිප්‍රේරණය" (Motivation) යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 02)

(b) පහත සඳහන් මිනිස් අවශ්‍යතා එකකට උදාහරණ දෙකක්(02) සහිතව පැහැදිලි කරන්න.

(i) ශාරීරික අවශ්‍යතා (Physiological needs).

(ii) සමාජීය අවශ්‍යතා (Social needs). (ලකුණු 04)

(c) පුහුණුව හා සංවර්ධනය (Training and Development) සංවිධානයක සාර්ථකත්වය සඳහා වැදගත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

05. (a) "නායකත්වය" (Leadership) සඳහා නිර්වචනයක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) සේවක නැඹුරු නායකත්ව ශෛලියක (Employee Oriented Leadership style) ස්වභාවය විස්තර කරන්න. (ලකුණු 03)

(c) සඵලදායී සංනිවේදනයක් සඳහා ඇති සංරෝධක (barriers) පහක්(05) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

06. (a) නිෂ්පාදන (Production) හා නිෂ්පාදිත (Product) සංකල්ප අතර වෙනස සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ස්පෘශ්‍ය භාණ්ඩයකට (tangible product) අදාල වන අලෙවි මිශ්‍රයේ අංග හතර(04) විස්තර කරන්න. (ලකුණු 04)

(c) කාර්යාලයක කාර්යයන් (functions of an office) සහ කාර්යාල කළමනාකරුගේ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

- o0o -